6.කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව **08**

7.අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව **09**

8.රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික
අධීක්ෂණ කාරක සභාව **10**

9.රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික
අධීක්ෂණ කාරක සභාව **11**

10.රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික
අධීක්ෂණ කාරක සභාව **12**

11.පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික
අධීක්ෂණ කාරක සභාව **13**

12.අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික
අධීක්ෂණ කාරක සභාව **14**

13.ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව **15**

14.ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව **16**

15.පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව **17**

16.විවෘත පාර්ලිමේන්තු මූලාරම්භය සඳහා වන පාර්ලිමේන්තු සංසදය **18**

17.විවෘත පාර්ලිමේන්තු මූලාරම්භය සඳහා වන පාර්ලිමේන්තු සංසදය **19**

ONE-TEXT INITIATIVE
trust. platform. dialogue. options.

01. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ

ආර්ථික අපහසුතාවයන් හේතුවෙන් පීඩාවට පත්ව සිටින ජනතාවට සහන සැලසීම සඳහා රජය විසින් හඳුන්වා දී ඇති රුපියල් බිලියන 71.7ක සහන පැකේජය යටතේ විවිධ අංශ සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන සහ එම මුදල් භාවිත කරන ආකාරය පිළිබඳව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

රුපියල් බිලියන 71.7 ක සහන පැකේජය යටතේ වැඩිම ප්‍රතිපාදන ප්‍රමාණයක් එනම් රුපියල් බිලියන 52.8 ක් ඛනිජ තෙල් අංශය සඳහා වෙන් කර ඇති බව මෙහිදී අනාවරණය විය. ඉන්ධන සමාගම්වල ගොඩබෑමේ පිරිවැය ඉහළ යාම හේතුවෙන් ඉන්ධන අලෙවියේදී ඇතිවිය හැකි පාඩු සහ ඒ හේතුවෙන් රට තුළ ඉන්ධන හිඟයක් ඇතිවීම වැළැක්වීම සඳහා මෙම සහනය ලබා දුන් බව නිලධාරීන් විසින් කාරක සභාව දැනුවත් කරන ලදී.

රුපියල් බිලියන 71.7 ක මුදල ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වන අතර ඒ 2026 මැයි සහ ජූනි මාසවලදී ලබා දෙන ලද ඉන්ධන සහනාධාර ඇතුළු සහන සඳහා වන ගෙවීම් පියවීම පිණිස නැවත වෙන් කරන ලද රුපියල් බිලියන 52.8 ක මුදල සහ අප්‍රේල් මාසයේ ඉන්ධන සහනාධාරය (සිපෙට්කෝ සහ අනෙකුත් ඉන්ධන සැපයුම්කරුවන් සඳහා), කුඩා තේ වතු හිමියන්ගේ පොහොර සහනාධාරය සහ ධීවර සහනාධාර සඳහා ලබා ගැනීම හේතුවෙන් අඩුවී තිබූ වාර්ෂික අයවැය සංචිතය නැවත පූරණය කිරීම පිණිස නැවත වෙන් කරන ලද රුපියල් බිලියන 18.9 ක මුදල වේ.

2026 ජූනි 11 වන දින මෙම කාරක සභාව විසින් සමාලෝචනය කරන ලද රුපියල් බිලියන 20 ක අතිරේක ඇස්තමේන්තුව මෙන්ම, මෙම ඉල්ලීම මගින් ද 2026 වසරේ වියදම් සීමාව හෝ ණය ගැනීමේ සීමාව හෝ ඉහළ නොයන බව ද මෙහිදී අනාවරණය විය. මෙය පවතින වෙන් කිරීම් නැවත ප්‍රති-වෙන්කිරීමක් (reallocation) පමණි.

සමස්ත රුපියල් බිලියන 71.7 ක මුදලම පියවනු ලබන්නේ 'දිට්වා' (Cyclone Ditwah) වෙනුවෙන් වෙන් කරන ලද 2026 අංක 01 දරන රුපියල් බිලියන 500 ක අතිරේක ඇස්තමේන්තුවෙන් භාවිත නොකළ ශේෂයන් ලබා ගැනීමෙනි. (2026 ජූනි 30 වන විට ඉන් නිකුත් කර තිබුණේ රුපියල් බිලියන 243.9 ක් පමණි).

ඒ අනුව මෙම සහනය ඉන්ධන සමාගම් සඳහා ලබාදෙන සහනාධාරයකට වඩා පාරිභෝගික සහනාධාරයක් ලෙස ක්‍රියාත්මක වන බවත්, එය පැවති තත්ත්වය මත ලබා දුන් තාවකාලික සහනයක් පමණක් බවත් මෙහිදී පැහැදිලි කෙරිණි.

2026 අප්‍රේල් මාසය සඳහා පමණක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුළු ඉන්ධන සැපයුම්කරුවන් සඳහා රුපියල් මිලියන 20,507ක පමණ සහනාධාරයක් ලබා දී ඇති බව ද මෙහිදී අනාවරණය විය. එම මුදලින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා රුපියල් මිලියන 15000ක් ද , ලංකා IOC සමාගම සඳහා රුපියල් මිලියන 2,340ක් ද, සයිනොපෙක් සමාගම සඳහා රුපියල් මිලියන 1,501ක් ද, RM Parks සමාගම සඳහා රුපියල් මිලියන 1,666ක් ද ගෙවා ඇති බව සඳහන් විය.

එමෙන්ම, රුපියල් බිලියන 71.7ක සමස්ත සහන පැකේජය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සඳහා රුපියල් බිලියන 15ක්, අස්වැසුම වැඩසටහන සඳහා රුපියල් බිලියන 8.2ක් ද, යළ කන්නයේ කෘෂිකාර්මික කටයුතු සඳහා රුපියල් බිලියන 3ක්, කුඩා වැවිලි කරුවන්

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

සඳහා රුපියල් බිලියන 2.2ක් ද සහ ධීවර කර්මාන්තය සඳහා රුපියල් බිලියන 1.2ක් ද වෙන් කර ඇති බව කාරක සභාවේදී සාකච්ඡා විය.

ඒවගේම, දිට්වා හේතුවෙන් සිදු වූ හානියෙන් පසු එහි ව්‍යාපෘතිවල වර්තමාන ප්‍රගතිය පිළිබඳව මාර්ග සංවර්ධනය අධිකාරිය විසින් කාරක සභාව දැනුවත් කරන ලදී. හානියට පත් වූ පාලම් ප්‍රතිසංස්කරණය සඳහා ඉන්දියානු සහ චීන රජයන් විසින් ආධාර ලබා දෙන බව මෙහිදී එම නිලධාරීහු පවසා සිටියහ. තවද, මධ්‍යම අධිවේගී මාර්ගයේ ගලගෙදර සහ රඹුක්කන පිවිසුම්වල වැඩකටයුතු 2028 වසර අවසානය වන විට නිම කිරීමට සැලසුම් කර ඇති බව ද එහිදී ප්‍රකාශ විය. අධිවේගී මාර්ගවල විදුලි සැපයුම සඳහා දැනටමත් ටෙන්ඩර් කැඳවා ඇති බවත්, ඉදිරි මාස තුන ඇතුළත එම කටයුතු ආරම්භ කිරීමට හැකි වන බවත් මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් නිලධාරීහු පැවසුහ.

තවද,'එල්නිනෝ' තත්ත්වය පිළිබඳව ද සාකච්ඡා වූ අතර, මෙවැනි දේශගුණික විපර්යාසයන් ඉදිරියේදී ද ඇති විය හැකි බැවින්, ඒවාට සාර්ථකව මුහුණ දීම සඳහා 'ආපදා කළමනාකරණ ව්‍යවස්ථාපිත අරමුදල' බලගැන්වීමේ වැදගත්කම කාරක සභාවේ සභාපතිවරයා අවධාරණය කළේය.

තවද, විගණකාධිපතිතුමියගේ වැටුප් නිර්ණය කිරීම සම්බන්ධයෙන් ද කාරක සභාවේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි. රාජ්‍ය සේවයේ වැටුප් ව්‍යුහය හා අදාළ කරුණු සම්බන්ධයෙන් ද මෙහිදී අදහස් හුවමාරු වූ අතර, ඒ පිළිබඳව අවසන් තීරණයකට එළඹීම සඳහා ඉදිරි දිනයකදී නැවත සාකච්ඡා කිරීමට කාරක සභාව තීරණය කළේය.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

02. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව

මත්පැන් බෝතල් සඳහා භාවිත කරන ආරක්ෂිත සලකුණු (Security Stickers) ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම හා පිරිවැය ඵලදායී කිරීමේ අවශ්‍යතාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් අවධාරණය කරන ලදී.

මත්පැන් බෝතල් සඳහා භාවිත කරන ආරක්ෂිත සලකුණු ක්‍රමවේදය, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි සහ 1971 අංක 38 දරන මුදල් පනත යටතේ ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීම සම්බන්ධ කරුණු විමර්ශනයට ලක් කෙරිණි.

මෙහිදී මත්පැන් බෝතල් සඳහා භාවිත කරන ආරක්ෂිත සලකුණු ක්‍රමවේදයේ පිරිවැය, තාක්ෂණික ප්‍රමිතීන් සහ රජයට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව කමිටුවේ දීර්ඝ අවධානය යොමු විය. 2016 අයවැය යෝජනා අනුව බදු නොගෙවන ලද මත්පැන් භාවිතය අවම කිරීම, සුරාබදු ආදායම තව දුරටත් සුරක්ෂිත කිරීම හා ව්‍යාජ මත්පැන් වැළැක්වීමේ අරමුණින් හඳුන්වා දුන් මෙම ක්‍රමවේදයේ කොන්ත්‍රාත්තුව 2017 වසරේදී ඉන්දීය සමාගමක් වන Madras Security Printers (MSP) වෙත ලබා දී ඇති බව කමිටුව හමුවේ අනාවරණය විය.

අධිවේගී මත්පැන් නිෂ්පාදන ක්‍රියාවලීන්හි භෞතික ස්ටිකර් භාවිතයේ ප්‍රායෝගික අපහසුතා හේතුවෙන් 2021 වසරේදී ඩිජිටල් (Inkjet) කේත මුද්‍රණයට අවසර ලබා දී ඇති අතර, මුද්‍රිත කඩදාසි ස්ටිකර් දහසක් සඳහා ගෙවන ඇමෙරිකානු ඩොලර් 5.99ක මුදලම ඩිජිටල් කේත මුද්‍රණය සඳහා ද ගෙවීම පිළිබඳව කමිටුවේ අවධානය යොමු විය. බෝතල් කිරීමේ කම්හල්වල ස්ටිකර් මුද්‍රණ යන්ත්‍ර සඳහා වන මූලික යටිතල පහසුකම් පිරිවැය සැලකිල්ලට ගත යුතු වුව ද, සාමාන්‍යයෙන් ඩිජිටල් ස්ටිකරයකට, කඩදාසි ස්ටිකරයට වඩා අඩු පිරිවැයක් දැරීමට ඉඩ ඇත. මෙම පිරිවැය ක්‍රමවේදය සහ රජයට ලැබෙන ප්‍රතිලාභ නැවත සලකා බැලීමේ අවශ්‍යතාව කමිටුව අවධාරණය කළේය.

එමෙන්ම, ආරක්ෂිත සලකුණු ක්‍රමවේදය සඳහා ජාත්‍යන්තර ISO ප්‍රමිතීන් ප්‍රමාණවත් ලෙස යොදා ගැනීම, මත්පැන් නිෂ්පාදනයේ සිට පාරිභෝගිකයා දක්වා නිෂ්පාදන ගලා යෑම නිරීක්ෂණය කිරීම සඳහා Track and Trace ක්‍රමවේදයක් හඳුන්වාදීම සහ ජංගම යෙදුමක් මගින් නිෂ්පාදන සත්‍යතාව තහවුරු කර ගැනීමේ පහසුකම් සැලසීම පිළිබඳව ද අවධානය යොමු විය.

නව ටෙන්ඩර් ක්‍රියාවලියේදී මිල සමඟ ගුණාත්මකභාවය, දත්ත ආරක්ෂාව සහ තාක්ෂණික ප්‍රමිතීන් සලකා බැලිය යුතු බවත්, ව්‍යාජ ස්ටිකර් සහ අනුකරණ වැළැක්වීම සඳහා තාක්ෂණික දැනුම සහිත නිලධාරීන් ටෙන්ඩර් ඇගයීම් සඳහා සම්බන්ධ කරගත යුතු බවත් කමිටුව අවධාරණය කළේය.

අනෙකුත් රටවල අනුගමනය කරන ක්‍රමවේද(global best practices) පිලිබඳ සොයා බලා වාර්තාවක් සකස් කර කමිටුවට ඉදිරිපත් කළ යුතු බව සුරාබදු දෙපාර්තමේන්තුවට දැනුම් දෙන ලදී.

මේ අතර, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කර ඇති නව රෙගුලාසි පිළිබඳව ද කමිටුවේ අවධානය යොමු විය. 2026 ජූලි 10 දිනැති අංක 2496/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති මෙම රෙගුලාසි මගින් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ බලහත්කාර ශ්‍රමය යොදා නිෂ්පාදනය කරන ලද

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කර ඇති අතර, වගකීම් සහගත වෙළෙඳාම සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්ට අනුකූල නීතිමය රාමුවක් ශක්තිමත් කිරීම එහි අරමුණ වේ. අදාළ ගැසට් පත්‍රය, පනතේ 20 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබේ. බලහත්කාරී ශ්‍රමය යොදාගෙන නිෂ්පාදනය කරන ලද භාණ්ඩ ආනයනය තහනම් කරමින් නිකුත් කළ ගැසට් නිවේදනය හේතුවෙන්, 2026 ජූලි 23 දින අවසන් කරන ලද එක්සත් ජනපදයේ '301 වගන්තිය' (Section 301) යටතේ ක්‍රියාත්මක බලහත්කාරී ශ්‍රමය ආශ්‍රිත තීරුබදු පියවරවලදී, ශ්‍රී ලංකාවට මුලින් නියමිතව තිබූ 12.5%ක මට්ටම වෙනුවට පහළම, වඩාත් වාසිදායක 10%ක කාණ්ඩයට ඇතුළත් වීමට හැකි විය.

තවද, 1971 අංක 38 දරන මුදල් පනත යටතේ ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීම සම්බන්ධයෙන් ද අවධානය යොමු වූ අතර, 1998 අංක 12 දරන පනතින් ස්ථාපිත කර 2019 අංක 15 දරන පනතින් සංශෝධනය කරන ලද එම අරමුදල, වර්තමාන සන්ධර්භයට නොගැළපීම, දුර්වල කාර්යසාධනය සහ වත්කම් ඌණ උපයෝජනය හේතුවෙන් මෙම අරමුදල විසුරුවා හැරීමට තීරණය කර ඇති බව සඳහන් විය. අරමුදල වසා දැමීමෙන් පසුව එමගින් ලබාදුන් අත්‍යවශ්‍ය සේවාවන් කම්කරු අමාත්‍යාංශය හරහා අඛණ්ඩව පවත්වාගෙන යමින්, වෙනම ආයතනික ව්‍යුහයක් පවත්වාගෙන යාමට වැයවන පිරිවැය ඉතිරි කර රාජ්‍ය සම්පත් වඩාත් ඵලදායී ලෙස භාවිත කිරීමට අපේක්ෂා කරන බව ද කමිටුව හමුවේ නිලධාරීහු පැහැදිලි කළහ.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

02. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

තැපැල් දෙපාර්තමේන්තුවේ 2004 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සිදුව ඇති මූල්‍ය වංචා සහ විනය විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් සිදු කෙරෙන විමර්ශනවල ප්‍රගතිය පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී (COPA විශේෂ අවධානය යොමු කෙරිණි.

විමර්ශන කටයුතු වඩාත් විධිමත් කිරීම සඳහා නව පරිගණකගත මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දී ඇති බවත්, ඒ මඟින් විමර්ශන ගොනු පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර ඒවායේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට කටයුතු කර ඇති බවත් මෙහිදී අනාවරණය විය. සුළු ස්වභාවයේ සිදුවීම් වෙනුවෙන් දීර්ඝ විමර්ශන පවත්වා සම්පත් වැය කිරීම වෙනුවට, වැදගත් මූල්‍ය වංචා සහ බරපතළ විනය විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ප්‍රමුඛතාව ලබා දී විමර්ශන කඩිනම් කිරීමේ අවශ්‍යතාව කාරක සභාව අවධාරණය කළේය.

තවද, ඇතැම් විමර්ශන වසර ගණනාවක් තිස්සේ අවසන් නොවීම, චෝදනා ලැබූ ඇතැම් පුද්ගලයන් අතුරුදන් වීම හෝ මියයාම හෝ, ඇතැම් සිද්ධීන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ප්‍රමාද වීම සහ විමර්ශන අංශයේ පවතින මානව සම්පත් හිඟය පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.

මූල්‍ය වංචා සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති නිලධාරීන්ට එරෙහි විමර්ශන සහ විනය ක්‍රියාමාර්ග නියමිත කාලසීමාවක් තුළ අවසන් කිරීමේ අවශ්‍යතාව ද කාරක සභාව අවධාරණය කළේය. එමෙන්ම, විමර්ශන අවසන් කර අදාළ වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අලාභ අයකර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කඩිනම් කරන ලෙස ද උපදෙස් ලබා දෙන ලදී.

තැපැල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේද තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද කාරක සභාවේ අවධානය යොමු විය.

මේ අතර, තැපැල් දෙපාර්තමේන්තුවේ අතිකාල දීමනා කළමනාකරණය විධිමත් කිරීම සම්බන්ධයෙන් ද මෙහිදී සාකච්ඡා කෙරිණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් පළාත් නවයම සහ මධ්‍යම තැපැල් හුවමාරුව ආවරණය වන පරිදි සිදු කළ වැඩ අධ්‍යයනය මත පදනම්ව ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් (Optimum Cadre) හඳුන්වා දීමට කටයුතු කරන බව නිලධාරීහු පැවසූහ.

අතිකාල දීමනා ගෙවීමේදී සේවක පැමිණීම නිවැරදිව තහවුරු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයට ගෙන ඇති බවත්, ඉදිරියේදී එම දත්ත පදනම් කර ගනිමින් අතිකාල දීමනා ගෙවීම් වඩාත් විධිමත් කිරීමට කටයුතු කරන බවත් මෙහිදී සඳහන් විය.

තැපැල් සේවාව නවීකරණය කිරීම සහ ඩිජිටල්කරණය කිරීම පිළිබඳව ද කාරක සභාවේ අවධානය යොමු වූ අතර, Speed Post, Cash on Delivery සහ International Courier වැනි අගය එකතු කළ සේවාවන් තවදුරටත් පුළුල් කිරීම, තැපැල් බැංකු සේවා ඩිජිටල්කරණය කිරීම සහ නව තාක්ෂණය ඔස්සේ තැපැල් දෙපාර්තමේන්තුවේ ආදායම් වර්ධනය කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳව සාකච්ඡා කෙරිණි.

එමෙන්ම, තැපැල් දෙපාර්තමේන්තුව සතු උපතැපැල් කාර්යාල ජාලය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ජනතාවට අත්‍යවශ්‍ය සේවාවන් සැපයෙන දුෂ්කර ප්‍රදේශවල උපතැපැල් කාර්යාල වසා දැමීමකින් තොරව පවත්වාගෙන යාමේ වැදගත්කම ද මෙහිදී අවධාරණය කෙරිණි.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

04. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2023 සහ 2024 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) අවධානය යොමු කෙරිණි.

මෙහිදී විශ්වවිද්‍යාලයේ පරිපාලන හා මූල්‍ය කළමනාකරණය, ආයතනික පාලනය, අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය, ඩිජිටල් පද්ධති කළමනාකරණය, විනය පරීක්ෂණ, විදේශ අධ්‍යයන නිවාඩු ලබා ගත් ආචාර්යවරුන්ගේ බැඳුම්කර ගිවිසුම් සහ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් ඇතුළු කරුණු රැසක් පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය දේශීය ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ස්ථානයක පසු වුව ද, ලෝක ශ්‍රේණිගත කිරීම්වල පසුබෑමක් පෙන්නුම් කරන බව කාරක සභාව හමුවේ අනාවරණය විය. එසේ වුව ද, එය විශ්වවිද්‍යාලයේ ගුණාත්මකභාවය පහත වැටීමක් නොව, ජාත්‍යන්තර තරඟකාරීත්වයේ වර්ධනයත් සමඟ ඇති වූ තත්ත්වයක් බව නිලධාරීහු පැහැදිලි කළහ.

විශ්වවිද්‍යාලයේ ඩිජිටල් පද්ධති සහ දත්ත කළමනාකරණය පිළිබඳව ද කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය. ERP පද්ධතියේ ස්ථාවර වත්කම් මොඩියුලය ක්‍රියාත්මක කිරීමේදී සේවාදායක ධාරිතාව ප්‍රමාණවත් නොවීම, තොරතුරු තාක්ෂණ අංශයේ මානව සම්පත් හිඟය, පෞද්ගලික අංශය හා සසඳන විට පවතින වැටුප් විෂමතා හේතුවෙන් දක්ෂ තාක්ෂණික නිලධාරීන් රඳවා ගැනීමේ අපහසුව, පද්ධති යාවත්කාලීන කිරීමේ ප්‍රමාදයන් සහ වසර ගණනාවක් අවසන් නොකළ මෘදුකාංග ව්‍යාපෘති පිළිබඳව ද සාකච්ඡා කෙරිණි.

පද්ධති නඩත්තු කිරීම සඳහා විශ්වවිද්‍යාලය තුළම ස්ථිර හා විශේෂඥ තාක්ෂණික කණ්ඩායමක් ගොඩනැගීමේ අවශ්‍යතාවය මෙහිදී කාරක සභාව අවධාරණය කළේය.

විනය පරීක්ෂණ සම්බන්ධයෙන් ද කාරක සභාව දැඩි අවධානය යොමු කළ අතර, ඇතැම් විනය ක්‍රියාමාර්ග වසර ගණනාවක් තිස්සේ අවසන් නොවීම, නීතිමය සහ පරිපාලනමය ප්‍රමාදයන් හේතුවෙන් ආයතනයට මූල්‍ය හා පරිපාලනමය අහිතකර බලපෑම් ඇති වී තිබීම පිළිබඳව සාකච්ඡා කෙරිණි. එවැනි කටයුතු කඩිනමින් නිම කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරක සභාව නිර්දේශ කළේය.

විදේශ අධ්‍යයන නිවාඩු ලබාගෙන නැවත සේවයට වාර්තා නොකළ ආචාර්යවරුන්ගේ බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ද කාරක සභාවේ අවධානය යොමු විය. මේ අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය තුළ බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කිරීම සම්බන්ධව මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ද මෙහිදී සාකච්ඡා කෙරිණි.

කෙසේ වෙතත්, 2025 වර්ෂයේදී පමණක් රුපියල් මිලියන 201ක මුදලක් අයකර ගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමත්ව ඇති බව නිලධාරීහු පෙන්වා දුන්හ. එසේම, මෙම ගැටලුව තනි විශ්වවිද්‍යාල මට්ටමින් විසඳිය නොහැකි බැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මැදිහත්ව සෑම රජයේ විශ්වවිද්‍යාලයකම අදාළ වන පරිදි ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ අවශ්‍යතාවය ද කාරක සභාව අවධාරණය කළේය.

තවද, බැඳුම්කර ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම පමණක් නොව, ඔවුන් ලෝකයේ කුමන රටක සිටිය ද අන්තර්ජාලය ඔස්සේ මෙරට සිසුන්ට ඉගැන්වීම් හා පර්යේෂණ සඳහා දායක කර ගැනීම වැනි විකල්ප ක්‍රමවේදයන් පිළිබඳව ද කාරක සභාවේ අවධානය යොමු විය.

අවසානයේදී, විශ්වවිද්‍යාලයේ පාලනය, විනිවිදභාවය සහ වගවීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා විගණන නිර්දේශ සහ කාරක සභාවේ නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස COPE කාරක සභාව නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

ONE-TEXT INITIATIVE

05. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

මෙහිදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය පරිපාලනය, අපජල කළමනාකරණය, පර්යේෂණ දීමනා ගෙවීම, ආයතනික පාලනය සහ ඉදිරි සංවර්ධන සැලසුම් පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි.

විශ්වවිද්‍යාලයේ අපජල පද්ධතිය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු වූ අතර, නේවාසිකාගාර කිහිපයකින් බැහැර වන අපජලය මුදාහැරීම හේතුවෙන් පරිසරයට සිදුවන බලපෑම පිළිබඳව සාකච්ඡා කෙරිණි. අපජල පද්ධතිය මහනුවර නාගරික අපජල ව්‍යාපෘතියට සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රමාදය හේතුවෙන් මුල් ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 464 සිට රුපියල් බිලියන 1.4ක් දක්වා ඉහළ ගොස් ඇති බවද මෙහිදී අනාවරණය විය. ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා ජයිකා ආයතනය හරහා රුපියල් බිලියන 2ක ප්‍රතිපාදන ලබාගෙන ඇති බව නිලධාරීහු පෙන්වා දුන්හ.

විශ්වවිද්‍යාලය සතුව පවතින බැංකු ගිණුම් 68ක් සහ විවිධ අරමුදල්වලට අදාළ ගිණුම් විශාල සංඛ්‍යාවක් පිළිබඳවද කාරක සභාවේ අවධානය යොමු විය. ඇතැම් ව්‍යාපෘති අවසන් වීමෙන් පසුවද ඒවාට අදාළ ගිණුම් වසා නොදමා පවත්වාගෙන යාම සහ අරමුදල් පිළිබඳ තොරතුරු මධ්‍යගතව නිරීක්ෂණය නොවීම සම්බන්ධයෙන් කාරක සභාව කරුණු විමසා සිටියේය.

පර්යේෂණ දීමනා ගෙවීම සම්බන්ධයෙන්ද මෙහිදී විශේෂ අවධානයක් යොමු වූ අතර, පර්යේෂණ කළමනාකරණ කමිටුවේ අනුමැතියකින් තොරව සහ පර්යේෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව අනධ්‍යයන හා විධායක කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 59 දෙනෙකුට පර්යේෂණ දීමනා ගෙවා ඇති බව සාකච්ඡාවේදී අනාවරණය විය. එම නිලධාරීන් අතරින් 28 දෙනෙකු 2023 ජුනි 30 වන විටත් අදාළ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබූ බවද සඳහන් විය.

පර්යේෂණ දීමනා පර්යේෂණ කටයුතු සඳහාම යොදාගැනීම සහ ඒ සඳහා නියමිත ක්‍රමවේදයට අනුව පර්යේෂණ යෝජනා, ප්‍රගති වාර්තා සහ අවසන් වාර්තා ලබාගැනීමේ අවශ්‍යතාව කාරක සභාව අවධාරණය කළේය. පර්යේෂණ කටයුතු දිරිමත් කළ යුතු වුවද, පර්යේෂණ දීමනා අමතර වැටුපක් ලෙස භාවිත කිරීම කිසිසේත්ම අනුමත කළ නොහැකි බවද කාරක සභාව පෙන්වා දුන්නේය.

තවද, විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (DMS) අනුමැතියකින් තොරව පවතින තනතුරු සහ සිදුකර ඇති දීමනා ගෙවීම් සම්බන්ධයෙන්ද කරුණු විමසන ලදී. රාජ්‍ය මූල්‍ය රෙගුලාසි සහ පවතින නීති රීතිවලට අනුකූල නොවන සියලුම තනතුරු හා ගෙවීම් නීත්‍යානුකූලව නිරවුල් කිරීමට පියවර ගන්නා ලෙස කාරක සභාව උපදෙස් ලබා දුන්නේය.

මේ අතර, විශ්වවිද්‍යාලයේ ඉදිරි සංවර්ධන සැලසුම් පැහැදිලි කාර්ය සාධන දර්ශක (KPIs) සහිතව සකස් කිරීමේ අවශ්‍යතාවද COPE කාරක සභාව අවධාරණය කළේය. අපජල හා කසළ කළමනාකරණය, නව සායනික බ්ලොක් ඉදිකිරීම ඇතුළු සංවර්ධන වැඩසටහන් කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙසද කාරක සභාව උපදෙස් ලබා දුන්නේය.

අදාළ විගණන විමසුම් සඳහා නිශ්චිත හා සෘජු පිළිතුරු ලබාදීම, සියලු අරමුදල් හා ගිණුම් පිළිබඳ නිසි මූල්‍ය තොරතුරු අනාවරණය කිරීම සහ විගණන නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ද කාරක සභාව අවධාරණය කළේය.

ONE-TEXT INITIATIVE
trust. platform. dialogue. options.

06. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

ජනාධිපති කාර්ය සාධක බලකායක් විසින් 2021 වර්ෂයේදී නිකුත් කරන ලද කාර්ය සංග්‍රහයක් ද ඇතුළත් කරමින් මෙම නව චක්‍රලේඛය නිකුත් කර ඇති බව අමාත්‍යවරයා පැවසීය. එය ක්‍රියාත්මක කිරීමේදී මතුවිය හැකි ප්‍රායෝගික ගැටලු විසඳීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්, දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ අදාළ රාජ්‍ය ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගන්නා බව ද අමාත්‍යවරයා සඳහන් කළේය.

කළුගල්, වැලි, පස්, බොරළු සහ මැටි වැනි ඛනිජ සම්පත් සඳහා අය කෙරෙන ගාස්තු නියාමනය කර ඒකාකාරී ගාස්තු ක්‍රමයක් හඳුන්වාදීමට ද පියවර ගෙන ඇති බව අමාත්‍යවරයා පැවසීය.

ඒ අනුව, අදාළ සියලු රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා කර විවිධ ගාස්තු ඒකාබද්ධ කර පොදු ඒකාකාරී ගාස්තු ක්‍රමයක් හඳුන්වාදීමට යෝජනා වී තිබේ. දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් නොවන පොදු ගාස්තු ක්‍රමයක් සකස් කර එය ජනතාවට විවෘතව ප්‍රකාශයට පත් කිරීමට ද අපේක්ෂා කෙරේ.

මෙම ඒකාකාරී ගාස්තු ක්‍රමය 2026 සැප්තැම්බර් 01 වැනිදා සිට ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇති අතර, බලපත්‍ර ලබාගන්නා පුද්ගලයාට විවිධ ආයතන වෙත වෙන වෙනම ගාස්තු ගෙවීම වෙනුවට එක් ස්ථානයකදී සියලු ගාස්තු ගෙවීමට හැකි ක්‍රමයක් හඳුන්වාදීම මෙහි අරමුණයි. එමඟින් අදාළ ආයතන අතර ගාස්තු බෙදාහැරීමේ ක්‍රියාවලිය ද විධිමත් කිරීමට හැකි බව ද අමාත්‍යවරයා සඳහන් කළේය.

කෙසේ වෙතත්, පළාත් පාලන ආයතන විසින් අය කරනු ලබන ගාස්තු ඇතුළු ඇතැම් ගාස්තු මධ්‍යම රජය හරහා ඒකාබද්ධව අය කළ හැකිද යන්න සම්බන්ධයෙන් පවතින නීතිමය හා පරිපාලන සීමාවන් පිළිබඳව ද අවධානය යොමු කරමින් අදාළ ක්‍රමවේදය තවදුරටත් සමාලෝචනය කිරීමට නියමිත බව ද මෙහිදී සඳහන් විය. තවද, කාර්මික අංශයේ නියැලෙන්නන් මුහුණ දෙන විවිධ ගැටළු පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු අමාත්‍යවරයාගේ අවධානයට යොමු කළහ.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

07. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

ගුණාත්මක අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම සඳහා ගුරු සේවයේ වෘත්තීයභාවය ඉහළ නැංවීම, ගුරු හිඟය විසඳීම, උසස් අධ්‍යාපන ආයතනවල මානව සම්පත් ශක්තිමත් කිරීම සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ව්‍යුහාත්මක ගැටලු සඳහා විසඳුම් ලබාදීම පිළිබඳව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අවධානය යොමු විය.

මෙම රැස්වීමේදී පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, ගුරු පුරප්පාඩු පිරවීම, ගුරු ස්ථාන මාරු ක්‍රියාවලිය විධිමත් කිරීම සහ දුෂ්කර ප්‍රදේශවල පාසල් සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳව සාකච්ඡා කෙරිණි.

විශේෂයෙන්ම විද්‍යා හා ගණිත විෂයන් සඳහා පවතින ගුරු හිඟය අවම කිරීම සඳහා නව බඳවා ගැනීම් ක්‍රියාවලිය කඩිනම් කිරීම සහ ගුරු අවශ්‍යතා පවතින ප්‍රදේශ හඳුනාගෙන අවශ්‍ය පියවර ගැනීම පිළිබඳව අවධානය යොමු විය. එමෙන්ම උතුරු හා නැගෙනහිර ප්‍රදේශ ඇතුළු ගුරු හිඟයට මුහුණ දෙන පාසල් සඳහා විශේෂ අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාව ද පෙන්වා දෙන ලදී.

ගුරු ස්ථාන මාරු ක්‍රියාවලිය විනිවිදභාවයෙන් සහ අනුමත ප්‍රතිපත්තිවලට අනුව ක්‍රියාත්මක කිරීම, දුෂ්කර සේවා දීමනා ලබාදීමේ ක්‍රමවේදය සහ පාසල් දුෂ්කරතාව තීරණය කිරීමේ නිර්ණායක යළි සමාලෝචනය කිරීම පිළිබඳව ද සාකච්ඡා විය.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම, ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තත්ත්ව සහතික ක්‍රියාවලිය ශක්තිමත් කිරීම පිළිබඳව ද අවධානය යොමු කෙරිණි.

මීට අමතරව පාසල් ඉඩම් හා යටිතල පහසුකම් සම්බන්ධ ගැටලු විසඳීම, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අන්තර්කරණ අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීම සහ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය සංශෝධන සිදු කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද අදහස් ඉදිරිපත් විය.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

08. රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල පවතින තදබදය අවම කිරීමේ අරමුණින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම පිළිබඳව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී පුළුල් ලෙස සාකච්ඡා කෙරිණි.

බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව, පුනරුත්ථාපන කාර්යාංශය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ඇතුළු රාජ්‍ය ආයතන මගින් පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කරනු ලබන බව එම ආයතනවල නිලධාරීහු කාරක සභාව හමුවේ පැහැදිලි කළහ.

මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අධිකරණය මගින් වරදකරුවන් වූ රැඳවියන් 4,962 දෙනාගෙන් 1,506 දෙනෙකු සඳහා මේ වන විට පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතින බව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීහු සඳහන් කළහ. අධිකරණ නියෝග මත යොමු කරන ලද පුද්ගලයින්ට සහ ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන රැඳවියන්ට මෙම පුනරුත්ථාපන වැඩසටහන් ලබා දෙන බවත්, විවිධ නඩු සම්බන්ධයෙන් දඬුවම් විඳින සියලුම රැඳවියන් සඳහා පුනරුත්ථාපන අවස්ථා ලබා දීමට හැකියාව නොමැති බවත් ඔවුහු පෙන්වා දුන්හ.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයින් ඉන් මුදවා ගැනීම සඳහා අවශ්‍ය පුනරුත්ථාපන වැඩසටහන් පුළුල් කිරීමට පියවර ගෙන ඇති බව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරීහු කාරක සභාව හමුවේ පැවසූහ. ඒ සඳහා අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීම සහ දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා සැලසුම් සකස් කර ඇති බව ද ඔවුහු සඳහන් කළහ.

පුනරුත්ථාපනය ලැබූ පුද්ගලයින් සමාජය තුළ පිළිගැනීම, එවැනි පුද්ගලයින් සඳහා යහපත් චරිත සහතික ලබා දීමේදී පවතින ගැටලු පිළිබඳව ද මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි. පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නීති හා රෙගුලාසි සංශෝධනය කිරීමේ අවශ්‍යතාව ද අවධාරණය කෙරිණි.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

09. රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

බන්ධනාගාරවල පවතින තදබදය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුවේ අදහස් හා යෝජනා ලබා ගැනීම කෙරෙහි රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවධානය යොමු විය.
එහිදී මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු කටයුතු ප්‍රමාද වීම, රජයේ රස පරීක්ෂක වාර්තා ලබාගැනීමේ ප්‍රමාදයන් සහ එමගින් රක්ෂිත බන්ධනාගාරගතව සිටින සැකකරුවන්ගේ සංඛ්‍යාව ඉහළ යාම පිළිබඳව ද අවධානය යොමු විය.
මත්ද්‍රව්‍ය මර්දනයේදී පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම පමණක් නොව, මත්ද්‍රව්‍ය ජාවාරම් ජාල සහ ඒවාට සම්බන්ධ නීති විරෝධී මූල්‍ය ගනුදෙනු හඳුනාගෙන පාලනය කිරීම සඳහා නවීන තාක්ෂණය භාවිත කිරීමේ අවශ්‍යතාව ද මෙහිදී අවධාරණය කෙරිණි. එමෙන්ම දුරකථන සමාගම් මගින් ක්‍රියාත්මක කරනු ලබන ඩිජිටල් මුදල් හුවමාරු ක්‍රම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින් නීති විරෝධී මූල්‍ය ගනුදෙනු සඳහා අවභාවිත කිරීම වැළැක්වීම සඳහා සුදුසු නියාමන ක්‍රමවේද හඳුන්වා දීමේ අවශ්‍යතාව ද මෙහිදී පෙන්වා දෙන ලදී.
තවද, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයන් සම්බන්ධයෙන් බන්ධනාගාරගත කිරීම වෙනුවට ප්‍රජාමූලික පුනරුත්ථාපන වැඩපිළිවෙළක් ශක්තිමත් කිරීම, අපරාධ වැළැක්වීම සඳහා මහජන සහභාගිත්වය වැඩිදියුණු කිරීම සහ පවතින නීති කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සංශෝධනය කිරීමේ අවශ්‍යතාව ද සාකච්ඡාවට ලක් විය.
එමෙන්ම, අපරාධ විමර්ශන කටයුතු කඩිනම් කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව තුළ නවීන අධිකරණ වෛද්‍ය විද්‍යාගාරයක් (Forensic Laboratory) ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද අදහස් ඉදිරිපත් විය. විද්‍යාත්මක සාක්ෂි විශ්ලේෂණය කඩිනම් කිරීම මඟින් නඩු කටයුතු වේගවත් කර බන්ධනාගාර තදබදය අවම කිරීමට හැකි වනු ඇති බව ද මෙහිදී පෙන්වා දෙන ලදී.
මීට අමතරව, පොලිස් නිලධාරීන්ගේ සුබසාධනය, වෘත්තීය පුහුණුව සහ විමර්ශන කුසලතා ඉහළ නැංවීම මෙන්ම පොලිස් කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේද වැඩිදියුණු කිරීම පිළිබඳව ද අවධානය යොමු විය.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

10. රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

මෙරට බන්ධනාගාර තදබදය සහ සිර ඝනත්වය අවම කිරීම සඳහා බන්ධනාගාර නිලධාරීන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම, රැඳවියන් වෙනත් බන්ධනාගාරවලට මාරු කිරීම, බන්ධනාගාර ආශ්‍රිත යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කිරීම, නව නීතිමය සංශෝධන හඳුන්වා දීම, යටිතල පහසුකම් පුළුල් කිරීම , නඩු කටයුතු කඩිනම් කිරීම සහ ප්‍රජා විශෝධනය ප්‍රවර්ධනය කිරීම වැනි රජය මගින් ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රධාන පියවරයන් පිළිබඳ කාරක සභාවේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි.

එහිදී විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත (Poisons, Opium and Dangerous Drugs Ordinance, - No. 17 of 1929) සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය කාරක සභාවේදී මතුවිය. මත් ද්‍රව්‍ය වෙළෙන්දන් (Drug Peddlers) සහ මත් ද්‍රව්‍ය ඇබ්බැහි වන්නන් අතර වෙනස පැහැදිලිව හඳුනා ගැනීම පිළිබඳව ද අදහස් පළ කෙරිණි.

එමෙන්ම චෝදනාවලට ලක් වන පුද්ගලයන් බන්ධනාගාරගත කිරීම වෙනුවට නිවාස අඩස්සියක තැබීම (House Arrest) සඳහා අවශ්‍ය තාක්ෂණික කටයුතු සම්පාදනය කිරීමට කටයුතු කරන බව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ නිලධාරිහු පෙන්වා දුන්හ.

ඇප ලබාදීමේ ක්‍රමවේද කාර්යක්ෂම කිරීම, නඩු විභාග ප්‍රමාදයන් අවම කිරීම, සුළු වැරදි සඳහා බන්ධනාගාරගත කිරීම වෙනුවට විකල්ප දඬුවම් ක්‍රම භාවිතය දිරිමත් කිරීම, බන්ධනාගාර කළමනාකරණය නවීකරණය කිරීම, නිලධාරීන් බඳවා ගැනීම සහ මානව සම්පත් හිඟය පියවීම, ආරක්ෂක සහ පුනරුත්ථාපන වැඩසටහන් ශක්තිමත් කිරීම, සුළු මත්ද්‍රව්‍ය වැරදි සහ අනෙකුත් සුළු අපරාධ සඳහා සිරදඬුවම් වෙනුවට ප්‍රජා සේවය, වැනි විකල්ප ක්‍රම සලකා බැලීම ආදී කරුණු පිළිබඳවද කාරක සභාවේ අවධානය යොමු විය.

මෙරට බන්ධාගාරගතව සිටින කාන්තා රැඳවියන් සහ ඔවුන් සමග සිටින වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ අභිවෘද්ධිය පිළිබඳව ද මෙහිදී කමිටුවේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර, උක්ත දරුවන් වසර 5න් පසු පරිවාස ගත කිරීම පිළිබඳව ද අවධානය යොමු විය. එයට අමතරව මත්ද්‍රව්‍යට ඇබ්බැහි වූ පුද්ගලයන් පුනරුත්ථාපනයට සහ ප්‍රජා විශෝධනයට යොමු කිරීම මෙන්ම ඇප ගෙවා ගත නොහැකිව බන්ධාගාර ගතව සිටින පුද්ගලයන් පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ද මෙහිදී කාරක සභාවේ අවධානය යොමු විය.

උක්ත කරුණු සම්බන්ධයෙන් කාරක සභාවේ අවසන් වාර්තාව සැකසීමට පෙර බන්ධනාගාර නිලධාරීන් හමුවී අදහස් ලබා ගැනීමටත්, බන්ධනාගාර කිහිපයකට ගොස් නිරීක්ෂණ සිදු කිරීමටත් කාරක සභාව එකඟ විය.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

11. පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ශ්‍රී ලංකාවේ ඉඩම් පරිපාලන පද්ධතිය වඩාත් විනිවිදභාවයෙන්, කාර්යක්ෂමව සහ ඩිජිටල් තාක්ෂණය ඔස්සේ නවීකරණය කිරීමේ අවශ්‍යතාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අවධාරණය කෙරිණි.
එහිදී රජයේ ඉඩම් අවභාවිතය සහ ව්‍යාජ ඔප්පු මගින් සිදුවන වංචා අවම කිරීම සඳහා සියලු ඉඩම් දත්ත ඒකාබද්ධ ඩිජිටල් පද්ධතියක් හරහා ජාලගත කිරීමේ අවශ්‍යතාව අවධාරණය විය. රජයේ ඉඩම්වල අයිතිය, සීමා නිර්ණය සහ අදාළ තොරතුරු එක් දත්ත පද්ධතියක් යටතේ පවත්වාගෙන යාම මගින් ඉඩම් පරිපාලනය වඩාත් විධිමත් කළ හැකි බවත්, GPS බණ්ඩාංක මත පදනම් වූ ජාතික ඩිජිටල් ඉඩම් දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම මගින් ඉඩම් වංචා අවම කිරීමට හැකි වන බවත් නිලධාරීහු පෙන්වා දුන්හ.
තවද, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, මහවැලි අධිකාරිජනතාවතු සංවර්ධන මණ්ඩලය ඇතුළු රාජ්‍ය ආයතන අතර ඉඩම් අයිතිය සහ සීමා නිර්ණය සම්බන්ධයෙන් පවතින සම්බන්ධීකරණ ගැටලු පිළිබඳව ද මෙහිදී අවධානය යොමු විය. ඉඩම් පරිපාලන ක්ෂේත්‍රයේ අවශ්‍ය නීතිමය හා පරිපාලනමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, ඩිජිටල් දත්ත පද්ධති හඳුන්වා දීම සහ රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම මගින් එම ක්ෂේත්‍රයේ විනිවිදභාවය හා කාර්යක්ෂමතාව තවදුරටත් ඉහළ නැංවිය හැකි බව කාරක සභාව අවධාරණය කළේය.
මේ අතර, 1958 අංක 29 දරන සත්ව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ද කාරක සභාවේදී සලකා බලා අනුමත කෙරිණි. යෝජිත සංශෝධන මගින් එළුවන්, ඌරන් සහ බැටළුවන් ප්‍රවාහනය,පනත යටතේ නියාමනයට ඇතුළත් කිරීමටත්, සතුන් ප්‍රවාහනය විධිමත් කිරීම මගින් පාද හා මුඛ රෝගය වැනි සත්ව රෝග පාලනයට පියවර ගැනීමටත් අපේක්ෂා කෙරේ.
එමෙන්ම, 2002 අංක 17 දරන මැනුම් පනත සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාවක් ද මෙහිදී සලකා බැලූ අතර, බලයලත් මිනින්දෝරුවරුන් විසින් සකස් කරන පෞද්ගලික පිඹුරුපත් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ලේඛනාගාරයේ තැන්පත් කිරීම, බුද්ධිමය දේපළ අයිතිය ආරක්ෂා කිරීම සහ මහජනතාවට සහතික කළ පිටපත් ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය රාමුවක් සකස් කිරීම පිළිබඳව සාකච්ඡා කෙරිණි.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

12. අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

පාර්ලිමේන්තුවේදී ලබන 20 වැනිදා විවාදයට ගැනීමට නියමිතව තිබෙන (දෙවැනි වර කියවීම) ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී පසුගියදා සළකා බැලිණි.

1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පනත යටතේ වන වැරදිවලට අදාළ දඩ මුදල් රුපියල් දස දහසේ සිට රුපියල් ලක්ෂය දක්වා ඉහළ දැමීම සඳහා ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කර ඇති බව මෙහිදී අදහස් දක්වමින් කම්කරු අමාත්‍යාංශයේ නිලධාරීහු පැවසූහ.

1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පනත මඟින්, වයස අවුරුදු 16ට අඩු ළමයින් සේවයේ යෙදවීම සම්පූර්ණයෙන්ම තහනම් කර ඇති අතර, එකී පනතේ විධිවිධාන පරිදි වයස අවුරුදු 16ට වැඩි එහෙත් 18ට අඩු තරුණ අය සේවයේ යෙදවීම සම්බන්ධයෙන් සේවා යෝජකයන් විසින් අනුගමනය කළ යුතු රෙගුලාසි පනවනු ලැබ ඇත. අදාළ පනත හා එකී පනතේ විධිවිධාන පරිදි නිකුත් කරනු ලැබ ඇති රෙගුලාසි අනුව, අදාළ වයස් සීමාවේ ළමයින් හා තරුණ අය සෞඛ්‍යයට, ආරක්ෂාවට හා සදාචාරයට හානි වන ආකාරයේ අනතුරුදායක රැකියාවක යෙදවීම දඬුවම් ලැබිය හැකි වරදකි.

එකී පනත සඳහා 2003 වර්ෂයේදී සිදු කරන ලද සංශෝධනය මඟින් එම පනතේ විධිවිධාන අනුව වරදකරු වන පුද්ගලයෙකුට රුපියල් 10,000/- නොඉක්මවන දඩ මුදලක් හෝ මාස 12ක් නොඉක්මවන කාලයක සිර දඬුවමක් යන දෙයාකාරයකින් එක් ආකාරයක දඬුවමක් හෝ එකී දඩය සහ සිර දඬුවම යන දෙකම සහ අධිකරණයේ අභිමතය පරිදි අගතියට පත් දරුවා වෙනුවෙන් වන්දි මුදලක් ද නියම කිරීම සඳහා විධිවිධාන හඳුන්වා දී ඇත. එහෙත්, අදාළ දඩ මුදල් වටිනාකම ප්‍රමාණවත් නොවන බවට නිරීක්ෂණය කර තිබේ.

එබැවින්, ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් සමඟ ද අනුගත වෙමින් 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පනතේ 7(3), 13(2) හා 20(අ)(3) වගන්තිවල සඳහන් අවම දඩ මුදල් වටිනාකම යාවත්කාලීන කොට සංශෝධනය කිරීම සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

එසේම කාරක සභාවේදී කම්කරු අමාත්‍යාංශයේ 2024 සහ 2025 වර්ෂවලට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තා, කම්කරු දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාව, මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාව, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනයේ 2023 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව සහ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2023 සහ 2024 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා සළකා බැලීම ද සිදුවිය.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

13. ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව

ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්‍රියාකාරිත්වය, බදු ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය සහ බදු පරිපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ අවධානය යොමු කරමින්, බදු පද්ධතිය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිතය, බදු පදනම පුළුල් කිරීම සහ ආයතනික හැකියාවන් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේදී අවධාරණය කෙරිණි.
එහිදී 2026 වර්ෂය සඳහා වූ බදු සැලැස්ම, 2026 ජූනි 30 දින දක්වා බදු ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය, ආදායම් ඇස්තමේන්තු, බදු වර්ග අනුව ආදායම් කාර්යසාධනය, බදු පදනම, වර්තමාන බදු අනුකූලතා තත්ත්වය, බදු ක්‍රමය සරල කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම සහ RAMIS පද්ධතියේ ප්‍රගතිය, ඩිජිටල් සේවා සඳහා අදාළ බදු, බදු පරිපාලනයේ අභියෝග සහ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු විය.
මෑත කාලීන බදු ප්‍රතිපත්ති සංශෝධන සහ ආදායම් කළමනාකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් රටේ මූල්‍ය ක්ෂේත්‍රයේ යම් ස්ථාවරත්වයක් ඇති වී ඇති බව සාකච්ඡාවේදී පෙන්වා දී ඇත. එම ප්‍රගතිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා බදු පරිපාලනය නවීකරණය කිරීම, බදු ගෙවන්නන්ගේ පදනම පුළුල් කිරීම සහ බදු අනුකූලතාව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව ද මෙහිදී අවධාරණය කෙරිණි.
බදු පද්ධතිය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා විද්‍යුත් සේවා පුළුල් කිරීම, ආයතන අතර දත්ත හුවමාරුව ශක්තිමත් කිරීම සහ ඩිජිටල් පද්ධති වැඩිදියුණු කිරීම පිළිබඳව ද සාකච්ඡා විය.
තවද, බදු පරිපාලනයේ පවතින අභියෝග ලෙස අවිධිමත් ආර්ථික ක්‍රියාකාරකම් බදු ජාලයට ඇතුළත් කිරීම, තාක්ෂණික පද්ධති යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව, දත්ත ඒකාබද්ධ කිරීමේ ගැටලු සහ විශේෂිත ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය පිළිබඳව ද මෙහිදී අවධානය යොමු විය.
එමෙන්ම, RAMIS පද්ධතිය වැඩිදියුණු කිරීම, විද්‍යුත් ලියාපදිංචි කිරීම, ගොනු කිරීම සහ ගෙවීම් ක්‍රමවේද පුළුල් කිරීම, දත්ත පද්ධති ඒකාබද්ධ කිරීම සහ බදු පරිපාලන ක්‍රියාවලීන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය ඉදිරි පියවර පිළිබඳව ද සාකච්ඡා කෙරිණි.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

14. ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව

අස්වැසුම වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේ වත්මන් නිර්ණායක සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් සිදු කෙරෙන ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳව ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේදී අවධානය යොමු විය.

අස්වැසුම වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී දැනට ක්‍රියාත්මක වන තේරීම් නිර්ණායකවල පවතින අඩුපාඩු හඳුනාගෙන ඒවා නිරාකරණය කිරීමේ අරමුණින් එම නිර්ණායක සමාලෝචනය කරන ලෙස කාරක සභාව මීට පෙර උපදෙස් ලබා දී තිබිණි.

ඒ අනුව පත් කරන ලද විශේෂඥ කමිටුව විසින් නිර්දේශ කර ඇති නව ක්‍රමවේදයට අදාළ නියමු අධ්‍යයනය (Pilot Study) සම්බන්ධයෙන් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ නිලධාරීන් විසින් කාරක සභාව දැනුවත් කරන ලදී.

දැනට ක්‍රියාත්මක වන ප්‍රතිලාභීන් තෝරාගැනීමේ නිර්ණායක වෙනුවට, සමාජ-ආර්ථික අවදානම් තත්ත්වයන් පදනම් කරගත් නව ක්‍රමවේදයක් හඳුන්වාදීමට යෝජනා කර ඇති බව මෙහිදී නිලධාරීහු සඳහන් කළහ. එම යෝජිත නව ක්‍රමවේදය පරීක්ෂා කිරීම සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක නියමු අධ්‍යයනයක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව ද ඔවුහු වැඩිදුරටත් සඳහන් කළහ.

මෙම නව ක්‍රමවේදය යටතේ එක් පවුලක රැකියා හා ජීවනෝපාය සුරක්ෂිතභාවය, පවුල් සංයුතිය, වයස්ගතභාවය, ආබාධිතභාවය, දිගුකාලීන රෝගී තත්ත්වයන්, නිවාස සහ මූලික සේවා සඳහා ප්‍රවේශය මෙන්ම ණය බර ඇතුළු සමාජ-ආර්ථික අවදානම් සාධක සලකා බැලීමට යෝජනා කර ඇති බව ද මෙහිදී අනාවරණය විය.

යෝජිත නව ක්‍රමවේදය සම්බන්ධයෙන් කාරක සභාවේදී දීර්ඝ ලෙස සාකච්ඡා කෙරුණු අතර, ඒ අනුව නියමු අධ්‍යයනය ක්‍රියාත්මක කිරීම සඳහා කාරක සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

15. පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව

මැතිවරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පුද්ගලයන් සහ සංවිධාන වෙතින් ලැබී ඇති යෝජනා 31ක් මෙන්ම මීට පෙර මැතිවරණ ප්‍රතිසංස්කරණවලට අදාළව ඉදිරිපත් කර ඇති පාර්ලිමේන්තු තේරීම් කාරක සභා වාර්තා සමාලෝචනය කර, වාර්තාවක් සකස් කිරීම සඳහා මැතිවරණ සම්බන්ධ නීති (පළාත් සභා ඡන්ද විමසීමට අදාළ නීති හැර) සමාලෝචනය කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සහ ඒ පිළිබඳ යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් විශේෂඥ මණ්ඩලයක් පත් කරන ලදී.

එහිදී 2004, 2007 සහ 2022 වසරවල පාර්ලිමේන්තු තේරීම් කාරක සභා වාර්තා මෙන්ම පුද්ගලයන් හා සංවිධාන විසින් ඉදිරිපත් කර ඇති යෝජනා 31ක් පදනම් කර ගනිමින් මැතිවරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි.

සාකච්ඡාවේදී පළාත් පාලන මැතිවරණ ක්‍රමය සඳහා මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීම, සුළු පක්ෂ හා සුළුතර කණ්ඩායම්වල නියෝජනය තහවුරු කිරීම, කාන්තා නියෝජනය වැඩිදියුණු කිරීම, විද්‍යුත් ඡන්ද ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ කල්තියා ඡන්දය ප්‍රකාශ කිරීමේ පහසුකම් සැලසීම ඇතුළු යෝජනා පිළිබඳව අවධානය යොමු විය. එමෙන්ම විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්ද අයිතිය ලබාදීම සම්බන්ධයෙන් වන යෝජනා පිළිබඳව ද සලකා බැලුණු අතර, ඒ සඳහා අවශ්‍ය නීතිමය හා පරිපාලනමය ප්‍රතිපාදන පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරිණි.

කාරක සභාව විසින් පත් කළ විශේෂඥ මණ්ඩලය මඟින් ලැබී ඇති යෝජනා 31 සහ පූර්ව පාර්ලිමේන්තු තේරීම් කාරක සභා වාර්තා විශ්ලේෂණය කර ප්‍රායෝගික නිර්දේශ සහිත වාර්තාවක් සකස් කිරීමට නියමිත අතර, එම නිර්දේශ සමාලෝචනය කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කිරීමට කාරක සභාව තීරණය කළේය

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

16. විවෘත පාර්ලිමේන්තු මූලාරම්භය සඳහා වන පාර්ලිමේන්තු සංසදය

තරුණ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් විවෘත පාර්ලිමේන්තු සංකල්පය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය මට්ටමේ වැඩමුළු තුනක් සංවිධානය කිරීම පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි..

ඒ අනුව, පළමු වැඩමුළුව 2026 අගෝස්තු 08 වැනිදා ගම්පහ දිස්ත්‍රික්කයේදී ද , දෙවන වැඩමුළුව අගෝස්තු 29 වැනිදා නැගෙනහිර පළාතේදී ද තෙවන වැඩමුළුව සැප්තැම්බර් 05 වැනිදා මහනුවරදී ද පැවැත්වීමට සංසදය එකඟ විය. මෙම වැඩමුළු මගින් විශේෂයෙන් තරුණ ප්‍රජාව පාර්ලිමේන්තු කටයුතු, ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සහ විවෘත පාර්ලිමේන්තු මූලධර්ම පිළිබඳ දැනුවත් කිරීම මෙන්ම, පාර්ලිමේන්තුව සහ පුරවැසියන් අතර සම්බන්ධතාව තවදුරටත් ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ.

එසේම, සංසදයේ සාමාජිකයන් සඳහා ඉන්දියාවේ විවෘත පාර්ලිමේන්තු භාවිතයන් සහ මහජන සහභාගීත්වය පිළිබඳ අත්දැකීම් අධ්‍යයනය කිරීමේ අරමුණින් අධ්‍යයන චාරිකාවක් සංවිධානය කිරීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි. මෙම රැස්වීමට සංසදයේ සාමාජික මන්ත්‍රීවරු සහ වැඩමුළු සඳහා අනුග්‍රාහකත්වය සපයන සංවර්ධන සහකරු වන CII (Coalition for Inclusive Impact) ආයතනයේ නියෝජිතයෝ එක්ව සිටියහ.

ONE-TEXT INITIATIVE
trust. platform. dialogue. options.

17. විවෘත පාර්ලිමේන්තු මූලාරම්භය සඳහා වන පාර්ලිමේන්තු සංසදය

තරුණ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් විවෘත පාර්ලිමේන්තු සංකල්පය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩමුළු මාලාව සංවිධානය කෙරෙන අතර සංසදයේ සාමාජික මන්ත්‍රීවරු මෙන්ම ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ද මෙම අවස්ථාවට සහභාගී වීමට නියමිතය.

මෙම වැඩමුළු මගින් විශේෂයෙන් තරුණ ප්‍රජාව පාර්ලිමේන්තු කටයුතු, ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සහ විවෘත පාර්ලිමේන්තු මූලධර්ම පිළිබඳ දැනුවත් කිරීම මෙන්ම, පාර්ලිමේන්තුව සහ පුරවැසියන් අතර සම්බන්ධතාව තවදුරටත් ශක්තිමත් කිරීම ද අපේක්ෂා කෙරේ.

මෙම රැස්වීමට සංසදයේ සාමාජික මන්ත්‍රීවරු සහ වැඩමුළු මාලාව සඳහා අනුග්‍රාහකත්වය සපයන සංවර්ධන සහකරු වන CII (Coalition for Inclusive Impact) ආයතනයේ නියෝජිතයෝ එක්ව සිටියහ.

මෙම වැඩමුළුව සඳහා සහභාගීවීමට අපේක්ෂා කරන ගම්පහ දිස්ත්‍රික්කයේ වයස අවු 18 – 35 අතර තරුණ තරුණියන් **https://forms.gle/aVp5UzhLbtPSmVap8** සබැඳිය ඔස්සේ අදාළ පෝරමය සම්පූර්ණ කොට ලියාපදිංචි විය විය යුතුය.

ONE-TEXT INITIATIVE
text. platform. dialogue. options.

ONE-TEXT INITIATIVE

trust. platform. dialogue. options.

18A, De Silva Lane, Rajagiriya
Tel 0112860785, 0701900091
Whatsapp 0701900091
email- admin@onetext.org
www.onetext.org

Thushara Weerarathna 0770738100

2026 Aug

ONE-TEXT INITIATIVE

trust. platform. dialogue. options.



ආංශික අධීක්ෂණ කාරක සභා,අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සහ වෙනත් කාරක සභාවන් වල තීරණ පිළිබඳ මාසික සංක්ෂිප්ත සටහන.

துறைசார் மேற்பார்வைக் குழுக்கள், அமைச்சக ஆலோசனைக் குழுக்கள் மற்றும் பிற குழுக்களின் முடிவுகளின் மாதாந்திர சுருக்கம்.

Monthly summary of decisions of Sectoral Oversight Committees, Ministerial Consultative Committees and other committees.

2026 Aug

01) அரசாங்க நிதி பற்றிய குழு 01 – 03

02) அரசாங்க நிதி பற்றிய குழு 04 -- 06

03) அரசாங்கக் கணக்குகள் பற்றிய குழு 07 – 08

04) அரசாங்க பொறுப்பு முயற்சிகள் பற்றிய குழு 09 --10

05) அரசாங்க பொறுப்பு முயற்சிகள் பற்றிய குழு 11 – 12

06) கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு 13 -- 14

07) கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு 15

08) அரசாங்க பொறுப்பு முயற்சிகள் பற்றிய குழு 16

09) கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு 17 -- 18

10) கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு 19 – 20

11) சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழு 21 -- 22

12) கல்வி, தொழிற்படை மற்றும் மனித மூலதனம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு 23 -- 24

13) வழிவகைகள் பற்றிய குழு 25 -- 26

14) வழிவகைகள் பற்றிய குழு 27

15) பாராளுமன்ற விசேட குழு 28

16) திறந்த பாராளுமன்ற முன்னெடுப்புக்கான பாராளுமன்ற ஒன்றியம் 29

17) திறந்த பாராளுமன்ற முன்னெடுப்புக்கான பாராளுமன்ற ஒன்றியம் 30

ONE-TEXT INITIATIVE
trust. platform. dialogue. options.

01) அரசாங்க நிதி பற்றிய குழு

பொருளாதார நெருக்கடிகளால் பாதிக்கப்பட்டுள்ள மக்களுக்கு நிவாரணம் வழங்குவதற்காக அரசாங்கத்தினால் அறிமுகப்படுத்தப்பட்டுள்ள 71.7 பில்லியன் ரூபா நிவாரணப் பொதியின் கீழ் பல்வேறு துறைகளுக்கு ஒதுக்கப்பட்டுள்ள நிதி மற்றும் அந்த நிதியைப் பயன்படுத்தும் விதம் தொடர்பில் அரசாங்க நிதி பற்றிய குழுவின் கவனம் செலுத்தப்பட்டது.

71.7 பில்லியன் ரூபா நிவாரணப் பொதியின் கீழ் அதிகூடிய நிதியான 52.8 பில்லியன் ரூபா எரிபொருள் துறைக்காக ஒதுக்கப்பட்டுள்ளதாக இதன்போது தெரியவந்தது. எரிபொருள் நிறுவனங்களின் இறக்குமதி மற்றும் இறக்குமதிப் பொருட்களை இறக்கி வைப்பதற்கான செலவுகள் அதிகரித்ததன் காரணமாக எரிபொருள் விற்பனையில் ஏற்படக்கூடிய நட்டத்தை ஈடுசெய்து, அதன் காரணமாக நாட்டில் எரிபொருள் தட்டுப்பாடு ஏற்படுவதைத் தடுப்பதற்காக இந்த நிவாரணம் வழங்கப்பட்டதாக அதிகாரிகள் குழுவுக்கு அறிவித்தனர்.

71.7 பில்லியன் ரூபா நிதியானது பிரதானமாக இரண்டு பகுதிகளைக் கொண்டுள்ளது. அதில், 2026 மே மற்றும் ஜூன் மாதங்களில் வழங்கப்பட்ட எரிபொருள் மானியங்கள் உள்ளிட்ட நிவாரணங்களுக்கான கொடுப்பனவுகளைத் தீர்ப்பதற்காக மீளொதுக்கப்பட்ட 52.8 பில்லியன் ரூபாவும், ஏப்ரல் மாத எரிபொருள் மானியம் (இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனம் மற்றும் ஏனைய எரிபொருள் வழங்குநர்களுக்காக), சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களுக்கான உர மானியம் மற்றும் மீன்பிடித் துறைக்கான மானியம் ஆகியவற்றை வழங்குவதற்காகப் பயன்படுத்தப்பட்டதன் காரணமாகக் குறைந்துள்ள வருடாந்த வரவு செலவுத் திட்ட கையிருப்பை மீள்நிரப்புவதற்காக மீளொதுக்கப்பட்ட 18.9 பில்லியன் ரூபாவும் அடங்குகின்றன.

2026 ஜூன் 11ஆம் திகதி இக்குழுவினால் மீளாய்வு செய்யப்பட்ட 20 பில்லியன் ரூபா குறைநிரப்பு மதிப்பீட்டைப் போலவே, தற்போதைய கோரிக்கையின் ஊடாகவும் 2026ஆம் ஆண்டுக்கான செலவின வரம்போ அல்லது கடன் பெறும் வரம்போ அதிகரிக்கப்படாது எனவும் இதன்போது தெரியவந்தது. இது ஏற்கனவே உள்ள ஒதுக்கீடுகளை மீள்பகிர்ந்தளிக்கும் (reallocation) நடவடிக்கை மாத்திரமே எனவும் தெரிவிக்கப்பட்டது.

மொத்தமாக 71.7 பில்லியன் ரூபா நிதியும் 'தித்வா' சூறாவளித் தாக்கத்தின் பின்னரான புனரமைப்புப் பணிகளுக்கு ஒதுக்கப்பட்ட 2026ஆம் ஆண்டுக்கான 01ஆம் இலக்க 500 பில்லியன் ரூபா குறைநிரப்பு மதிப்பீட்டில் பயன்படுத்தப்படாத

ONE-TEXT INITIATIVE

மீதித் தொகையிலிருந்து பெறப்படவுள்ளது. (2026 ஜூன் 30ஆம் திகதி வரை அதிலிருந்து 243.9 பில்லியன் ரூபா மாத்திரமே வெளியிடப்பட்டிருந்தது.)

இதன்படி, இந்த நிவாரணமானது எரிபொருள் நிறுவனங்களுக்கு வழங்கப்படும் மானியத்தை விடவும், நுகர்வோருக்கான மானியமாகவே நடைமுறைப்படுத்தப்படுவதாகவும், நிலவிய சூழ்நிலையின் அடிப்படையில் வழங்கப்பட்ட தற்காலிக நிவாரணம் மாத்திரமே எனவும் இதன்போது தெளிவுபடுத்தப்பட்டது.

2026 ஏப்ரல் மாதத்திற்கு மாத்திரம் இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனம் உள்ளிட்ட எரிபொருள் வழங்குநர்களுக்கு சுமார் 20,507 மில்லியன் ரூபா மானியம் வழங்கப்பட்டுள்ளதாகவும் இதன்போது தெரியவந்தது. இதில் இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்திற்கு 15,000 மில்லியன் ரூபாவும், லங்கா IOC நிறுவனத்திற்கு 2,340 மில்லியன் ரூபாவும், சினோபெக் நிறுவனத்திற்கு 1,501 மில்லியன் ரூபாவும், RM Parks நிறுவனத்திற்கு 1,666 மில்லியன் ரூபாவும் செலுத்தப்பட்டுள்ளதாகத் தெரிவிக்கப்பட்டது.

அத்துடன், 71.7 பில்லியன் ரூபா மொத்த நிவாரணப் பொதியின் கீழ் இலங்கை மின்சார சபைக்கு 15 பில்லியன் ரூபாவும், அஸ்வெசும வேலைத்திட்டத்திற்கு 8.2 பில்லியன் ரூபாவும், யாழ் பருவகால விவசாய நடவடிக்கைகளுக்காக 3 பில்லியன் ரூபாவும், சிறு தோட்ட உரிமையாளர்களுக்காக 2.2 பில்லியன் ரூபாவும், மீன்பிடித் துறைக்காக 1.2 பில்லியன் ரூபாவும் ஒதுக்கப்பட்டுள்ளதாகக் குழுவில் கலந்துரையாடப்பட்டது.

மேலும், 'தித்வா' சூறாவளியினால் ஏற்பட்ட சேதங்களுக்குப் பின்னர் வீதி அபிவிருத்தி அதிகாரசபையின் திட்டங்களின் தற்போதைய முன்னேற்றம் தொடர்பில் அதிகாரசபையின் அதிகாரிகள் குழுவுக்கு அறிவித்தனர். சேதமடைந்த பாலங்களைப் புனரமைப்பதற்காக இந்திய மற்றும் சீன அரசாங்கங்கள் உதவிகளை வழங்குவதாகவும் அவர்கள் தெரிவித்தனர்.

மேலும், மத்திய அதிவேக நெடுஞ்சாலையின் கலகெதர மற்றும் ரம்புக்கனை நுழைவாயில்களின் நிர்மாணப் பணிகளை 2028ஆம் ஆண்டு இறுதிக்குள் நிறைவு செய்யத் திட்டமிடப்பட்டுள்ளதாகவும் இதன்போது தெரிவிக்கப்பட்டது. அதிவேக நெடுஞ்சாலைகளுக்கான மின்சார விநியோகத்தை ஏற்படுத்துவதற்கான கேள்விப்பத்திரங்கள் ஏற்கனவே கோரப்பட்டுள்ளதாகவும், அடுத்த மூன்று மாதங்களுக்குள் அந்தப் பணிகளை ஆரம்பிக்க முடியும் எனவும் அதிகாரிகள் மேலும் தெரிவித்தனர்.

ONE-TEXT INITIATIVE

மேலும், ‘எல் நினோ’ நிலைமை தொடர்பிலும் கலந்துரையாடப்பட்டது. எதிர்காலத்திலும் இவ்வாறான காலநிலை மாற்றங்கள் ஏற்படக்கூடும் என்பதால், அவற்றை வெற்றிகரமாக எதிர்கொள்வதற்காக ‘அனர்த்த முகாமைத்துவ சட்டபூர்வ நிதியத்தை’ வலுப்படுத்துவதன் முக்கியத்துவத்தை குழுவின் தலைவர் வலியுறுத்தினார்.

அத்துடன், கணக்காய்வாளர் நாயகத்தின் சம்பளத்தை நிர்ணயிப்பது தொடர்பிலும் குழுவில் விரிவாகக் கலந்துரையாடப்பட்டது. அரச சேவையின் சம்பளக் கட்டமைப்பு மற்றும் அது தொடர்பான விடயங்கள் குறித்தும் இதன்போது கருத்துப் பரிமாற்றங்கள் இடம்பெற்றதுடன், இது தொடர்பில் இறுதித் தீர்மானமொன்றை மேற்கொள்வதற்காக எதிர்வரும் தினமொன்றில் மீண்டும் கலந்துரையாடுவதற்கு குழு தீர்மானித்தது.

ONE-TEXT INITIATIVE

02) அரசாங்க நிதி பற்றிய குழு

